බිංගිරිය ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී මිලදීගත් රු.191,200 ක් වටිනා වීඩී පහන් උපකරණ ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලදී නිකුත් කරන ලද රු.69,000 ක් වූ ක්‍රීඩා උපකරණ භෞතිකව සභාව සතුව නොපැවතියද, ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) රු.875,520 ක් වටිනා ඡායා පිටපත් යන්ත්‍ර 03 ක්, පරිගණක යන්ත්‍ර 05 ක් හා පරිගණක අයිතමයන් 08 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත නොකර තොග යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල් ලෙජර් ගිණුමේ රු.3,499,237 ක ශේෂය ශේෂ පිරික්සුම තුළ රු.3,416,816 ක් ලෙස දැක්වීමෙන් එම ශේෂය රු.82,421 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 1.3.2 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 04 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂයන් හා උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.12,654,142 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) සේවක ඇප සභාවේ වත්කමක් මෙන්ම වගකීමක් වූවත් ඇප ආයෝජන ගිණුම් ශේෂ රු.39,885 ක් වූ අතර සේවක ඇප ගිණුමේ ශේෂය රු.78,085 ක් වූයෙන් රු.38,200 ක නොසැසඳීම් අනාවරණය විය.

## 1.3.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු.1,539,706 ක අවිනිශ්චිත ගිණුම් බැර ශේෂයක් පැවතුණි. මේ තුළ 2015 වර්ෂය තුළ එකතු වූ රු.52,720 ක ශේෂයක්ද තිබුණි.

## 1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

### (අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.33,866,701 ක් වූ අතර රු.261,443 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

(ii) රාජ්‍ය මුදල් හා ගිණුම් අධ්‍යක්ෂක ජනරාල්ගෙන් ලැබිය යුතු රු.200,000 ක ශේෂය වර්ෂ 05 ක පමණ කාලයක සිට පවතින අතර ලැබිය යුතු ශේෂයක් ලෙස තහවුරු කළහැකි ලේඛන සහ ගිණුම්කරණ සාක්ෂි නොතිබුණි.

(iii) අගරු චෙක්පත් මත ලැබිය යුතු රු.61,443 ක ශේෂය වර්ෂ 03 කට වැඩි කාලයක් තිස්සේ පවතින අතර අගරු සටහන හෝ හිඟ ශේෂයක් ලෙස හඳුනාගත හැකි තොරතුරු කිසිවක් නොතිබුණි.

### (ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.27,749,225 ක් විය. මින් රු.508,206 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

(ii) ජල ව්‍යාපෘති ණයහිමියෝ රු.310,031 ක් වර්ෂ 03 ට වැඩි කාලයක සිට ගිණුම් තුළ පවතින අතර ගෙවිය යුතු පාර්ශව, කාරණය හා ඒ සම්බන්ධිත ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.242,889 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු රු.44,341 ක් සභාව විසින් 2014 වර්ෂයට පෙර අයකර තිබුණද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.77,759,042 ක් වටිනාකමැති ගිණුම් විෂයයන් 08 කට අදාලව සැසඳුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් පිළිබඳව සතුටුදායක පරීක්ෂාවක් කළ නොහැකි විය.

### 1.3.6 නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව නිකුත් කළ දින සිට මාස 06 ක් ඉක්මවූ ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.189,089 ක් වටිනා චෙක්පත් 57 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,035,047 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,496,005 ක් වීමෙන් මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.460,958 ක පිරිහීමක් පැවතුණි.මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.26,162,115 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.31,602,455 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.594,707 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තත්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | ආදායම 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | වියදම 2014 | චලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 25,736 | 30,492 | (4,756) | පෞද්ගලික පඩිනඩි | 43,134 | 32,244 | 10,890 |
| (ii) | වෙනත් | 46,543 | 39,976 | 6,567 | අනෙකුත් | 23,110 | 26,565 | (3,455) |
| | උප එකතුව | 72,279 | 70,468 | 1,811 | උප එකතුව | 66,244 | 58,809 | 7,435 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 26,162 | 13,557 | 12,605 | ප්‍රාග්ධන | 31,602 | 37,092 | (5,490) |
| | මුළු එකතුව | 98,441 | 84,025 | 14,416 | වියදම මුළු එකතුව | 97,846 | 95,901 | 1,945 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 6,035 | 11,659 | (5,624) | අතිරික්තය/ ඌනතාවය | (595) | (11,876) | 12,471 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.72,279,719 න් දළ වශයෙන් සියයට 64 ක් හෙවත් රු.46,543,000 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.26,162,115 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.66,244,671 න් දළ වශයෙන් සියයට 65 ක් හෙවත් රු.43,134,796 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 85 ක් හෙවත් රු.36,989,877 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.31,602,455 න් දළ වශයෙන් සියයට 17 ක් හෙවත් රු.5,440,340 ක් පමණක් සභා අරමුදල් වැයවූ අතර ඉතිරි සියයට 83 ක් වූ රු.26,162,115 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදනවලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂ හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තු ගත | 2015 තථ්‍ය | 2015 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තු ගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 2,803 | 3,692 | 207 | 2,666 | 2,108 | 260 |
| (ii) බදුකුලී | 12,090 | 10,755 | 609 | 14,351 | 10,217 | 624 |
| (iii)බලපත්‍ර ගාස්තු | 380 | 1,798 | - | 330 | 336 | - |
| (iv)වෙනත් ආදායම් | 70,850 | 56,035 | 28,783 | 64,795 | 44,343 | 24,716 |
| එකතුව | 86,123 | 72,280 | 29,599 | 82,142 | 57,004 | 25,600 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | ආදායම් රැස් කිරීම 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | හිඟහිටි ශේෂය බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| වරිපනම් හා බදු (10) | 260 | 3,096 | 3,356 | 151 | 2,998 | 3,149 | 109 | 98 | 207 |
| බදු කුලී (20) | 624 | 3,504 | 4,128 | 116 | 3,403 | 3,519 | 508 | 101 | 609 |
| බලපත්‍ර ගාස්තු (30) | - | 88 | 88 | - | 88 | 88 | - | - | - |
| වෙනත් ආදායම් (40,50,60,70) | 24,716 | 60,100 | 84,816 | 24,716 | 31,317 | 56,033 | - | 28,783 | 28,783 |
| එකතුව | 25,600 | 66,788 | 92,388 | 24,983 | 37,806 | 62,789 | 617 | 28,982 | 29,599 |

(අ) වරිපනම් හා බදු යටතේ සමාලෝචිත වර්ෂයට අදාල රු.3,096,000 ක ආදායමක් බිල්කර පැවතියද, එයින් අයකර තිබුණේ රු.2,998,211 ක් හෙවත් සියයට 96 ක් පමණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.206,875 ක හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල් කිරීම්වලින් සියයට 6.6 ක් විය.

(ආ) බදු කුලී යටතේ සමාලෝචිත වර්ෂයට අදාල රු.3,504,444 ක ආදායමක් බිල්කර තිබුණද, එයින් අයකර තිබුණේ රු.3,402,678 ක් හෙවත් සියයට 97 ක් පමණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.609,038 ක හිඟයක් පැවති අතර එය වාර්ෂික බිල් කිරීම් වලින් සියයට 17 ක් විය.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.8,000,000 ක් වුවද, පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.6,989,066 ක මුදලක් පමණක් වර්ෂය තුලදී ලැබී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.9,000,000 ක් ලෙස ඇස්තමේන්තුගත කර තිබුණු නමුත් එයින් ලැබී තිබුනේ රු.15,919,975 ක ප්‍රමාණයක් පමණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විවිධ අවස්ථාවලදී සභාවට ලැබී විවිධ තැන්පතු යටතේ දක්වා තිබුණ මුදලින් වසර 4 කට වැඩි කාලයක් නිරවුල් නොකළ ශේෂවල වටිනාකම රු.98,814 ක් වී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අනුමත ආදායම් පරීක්ෂක තනතුරු 3 ක් වූ අතර තත්‍ය සංඛ්‍යාව දෙදෙනෙකු වූයෙන් සභාපතිවරයා විසින් නිසි අනුමැතියකින් තොරව ක්ෂේත්‍ර ආදායම් එකතු කිරීම සඳහා කම්කරුවෙකු 2014 ජනවාරි 01 දින සිට පත්කර තිබුණි.

### 3.2 නිවාස දේපල සංවර්ධනය හා ඉඩම් කට්ටි කිරීම

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 (1) ප්‍රකාරව විකුණුම් මුදල් මත සියයට 1 ක බදු මුදල ත්‍රෛමාසික විකුණුම් වාර්තා මත ගණනය නොකර ඇස්තමේන්තු විකුණුම් වටිනාකම මත ලබාගෙන තිබුණි.

(ආ) වයඹ මධ්‍යම පරිසර අධිකාරියෙන්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්, පොල්වගා කිරීමේ මණ්ඩලයෙන් හා ඉඩම් කැබලි කිරීමේ පාලන මණ්ඩලයෙන් වාර්තා ලබා නොගෙන සංවර්ධන සැලසුම් හා කට්ටි සැලසුම් අනුමත කර තිබුණි.

(ඇ) බිංගිරිය බෝවත්ත වතුයාය අක්කර 21 රූඩ් 01 පර්චස් 14 ඉඩම නිවාස දේපල සඳහා සංවර්ධනය කිරීම හා ඉඩම් කට්ටි කිරීමට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉඩම් කට්ටි කිරීමේ ලේඛනය හා සියයට 01 ක බදු මුදල් ගෙවීම් අනුව අනු අංක 61 සහ 64 ලෙස ලේඛනගත කර තිබූ මෙම ඉඩම් ඔප්පු අංක 226 හා 113 ලෙස කැබලි 02 ක් විය. එසේ වුවද, 2015 ජූනි 24 දින තේ, පොල් හා රබර් වතු කැබලි කිරීමේ පාලන මණ්ඩලය මඟින් අයිතිකරු වෙත නිකුත් කළ ලිපිය අනුව මෙම ඉඩම එක් ඉඩමක් බවට සඳහන් වන බව නිරීක්ෂණය වුණි. ඒ අනුව නිවාස දේපල සංවර්ධනය කිරීමේ හා ඉඩම් කට්ටි කිරීමේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලින් හිතාමතා මග හැරීමට අදාල පාර්ශවයන් කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

(ii) ඉඩමේ අයිතිය සම්බන්ධව ගැටළුවක් පැවති බව ලේඛන පරීක්ෂාවේදී තහවුරු වුවද, දේපල වෙන්දේසි සමාගමට නීත්‍යානුකූල අයිතිය ඇත්ද යන්න කුලියාපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් තහවුරු කර ගැනීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර නොතිබුණි.

(iii) පළාත් පාලන කොමසාරිස්ගේ 2015 අප්‍රේල් 27 දිනැති අංක සං/15/1/2 දරන ලිපිය මඟින් මූලික විමර්ශන අවසන් වන තෙක් මෙම ඉඩම් කට්ටි කර විකිණීම වහාම නතර කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රාදේශීය සභා ලේකම් වෙත දැනුම් දී තිබුණද, අදාල ලිපිගොණු හා විමර්ශන ප්‍රතිඵල ඉදිරිපත් කිරීමටත් ප්‍රථමයෙන් පළාත් පාලන කොමසාරිස් විසින් නැවත ඉඩම් කට්ටි කිරීමට අවසර දී තිබුණි.

(iv) තේ, රබර් හා පොල්වතු කැබලි කිරීමේ පාලන මණ්ඩලය විසින් පොල් ඉඩම් නඩත්තු කිරීම, මාර්ග ඉදි කිරීමේදී ඉවත්වන පොල්ගස් සඳහා නැවත පොල් වගා කිරීම, අදාල ව්‍යාපෘති පොල් වගා කිරීමේ මණ්ඩලයේ සුපරීක්ෂණය යටතේ සිදු කිරීම යන කොන්දේසිද ඇතුලත්ව පැවරීමේ කටයුතු සිදු කිරීමට උපදෙස් ලබාදී තිබුණද, ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.3** <u>මතභේදයට තුඩුදෙන ගණුදෙනු</u>

2015 ජනවාරි 11 දින සහ 12 දෙදින තුල ප්‍රාදේශීය සභාවට අයත් බෝවත්ත, විලත්තව, පඩිවෙල සහ වීර පොකුණ යන සතිපොලවල් වල ආදායම් නොහඳුනන පුද්ගලයින් විසින් එකතු කිරීම සිදු කළද, එම පුද්ගලයින් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 වත්කම් කළමනාකරණය

**නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සභාව විසින් කුට්ටිගල් නිෂ්පාදන අංගනය හා නිෂ්පාදන යන්ත්‍ර දෙකක් සඳහා රු.587,350 ක් වැයකළද, වසර දෙකකට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2000 වර්ෂයේදී ලබා ගන්නා ලද අංක GC – 4267 දරන ඉසුසු ටිපර් රථය වර්ෂ 03 ට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

## 05 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ආදායම් පරිපාලනය